ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

**<u>ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා Voice of Global South (වොයිස් ඔෆ් ග්ලෝබල් සවුත්) සමුළුව සඳහා සහභාගී වේ</u>**

ඉන්දියාව 2023 ජනවාරි 12-13 දිනයන් හිදී Voice of Global South නමින් දෙදින සමුළුවක් අතථ්‍ය අයුරින් පවත්වන ලදී. සැසි 10කින් සමන්විත වූ මෙම සමුළුවට ශ්‍රී ලංකාව ඇතුළු ගෝලීය දකුණේ රටවල් 125ක නායකයන් සහ අමාත්‍යවරු සහභාගී වූහ.

2. "හඬෙහි එක්සත් බව, අරමුණෙහි එක්සත් බව" යන තේමාව යටතේ පැවති අනන්‍ය ආකාරයක මෙම සමුළුවෙහි මූලික අවධානය යොමු වූයේ සංවර්ධනය වන ලෝකයේ ප්‍රමුඛතා, දෘෂ්ටිකෝණ සහ ගැටළු සම්බන්ධයෙනි. විශේෂයෙන්ම සෞඛ්‍යය, ආහාර සුරක්ෂිතතාවය, බලශක්තිය සඳහා දැරිය හැකි ප්‍රවේශය, දේශගුණික මූල්‍ය සහ තාක්ෂණය සහ ආර්ථික වර්ධනය යනාදියට අභියෝගයන් එල්ල වූ වත්මන් ලෝකය දුෂ්කර කාලසීමාවක් පසු කරන සමයක මෙම සමුළුව විශේෂ අදාළත්වයක් උසුළයි.

3. සමාරම්භක නායක සැසිය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2023 ජනවාරි 12 වන දින පැවැත්විණ. එයින් අනතුරුව සංවර්ධන ලෝකය විසින් මුහුණ දෙන බරපතලම ගැටළු විසඳීම අරමුණු කරගත් අමාත්‍ය මට්ටමේ සැසි අටක් පවත්වන ලදී. නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සමාප්ති නායක සැසිය සමඟින් 2023 ජනවාරි 13 වන දින මෙම සමුළුව සාර්ථකව නිමා විය.

4. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමාප්ති නායක සැසිය සඳහා සහභාගී විය. මෙම සැසිය අමතමින් එතුමා සංවර්ධනය වන ලෝකයේ ආර්ථික ගැටළු පිළිබඳව අවධාරණය කළේය. ණය අර්බුදයකට

මුහුණ දෙන සංවර්ධනය වන රටවල් සහ G20 සංවිධානය අතර පාලමක් ලෙස ක්‍රියා කිරීමට ඉන්දියාව අතිශයින්ම යෝග්‍ය ස්ථානයේ පසුවන බව එතුමා ප්‍රකාශ කළේය.

5. සමාප්ති නායක සැසියේ දී අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් නව යෝජනා ගණනාවක් ඉදිරිපත් කරන ලදී. ඒවා නම්,

- ආරෝග්‍යා මෛත්‍රී
- ගෝලීය දකුණු විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානය
- ගෝලීය දකුණු විද්‍යා සහ තාක්ෂණ වැඩසටහන
- ගෝලීය දකුණු තරුණ රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ සංසදය
- ගෝලීය දකුණු ශිෂ්‍යත්ව

6. මුදල් රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමා 2023 ජනවාරි 12 වන දින පැවති මුදල් අමාත්‍යවරුන්ගේ සැසිය සඳහා සහභාගී විය. මෙම සැසියේදී අමාත්‍යවරු ගෝලීය දකුණේ සංවර්ධන අවශ්‍යතා මූල්‍යනය කිරීම, මූල්‍ය අන්තර්කරණය ළඟා කරගැනීම, මූල්‍ය ක්ෂේත්‍රය තුළ ඩිජිටල් පොදු භාණ්ඩ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල අරමුණු කරගත් සහ මූල්‍ය වශයෙන් තිරසාර සංවර්ධන සහයෝගීතාවයන් සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගත්හ.

7. සමුළුව සඳහා සහභාගී වූ රටවල් මෙම නව ප්‍රවේශය අගය කළ අතර සමුළුව ඵලදායි සාකච්ඡා සඳහා අවස්ථාව ලබා දුන් බව ද ඔවුන්ගේ ප්‍රමුඛතා සහ අභියෝග ජය ගැනීම ස ඳහා ක්‍රියාමාර්ග වෙත යොමු වූ න්‍යාය පත්‍රයක් හරහා නව මාර්ගයක් නිර්මාණය කළ බව ද ප්‍රකාශ කළහ. ගෝලීය අභියෝග ජයගැනීම ස ඳහා වන ගවේශණය සහ න්‍යාය පත්‍රයට ලොව විශාලතම පාර්ශවකරුවා වන ගෝලීය දකුණේ හඬ ඇතුළත් විය යුතු බව ඔව්හු අවධාරණය කළහ.

***

කොළඹ

2023 ජනවාරි 15